**නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය - 2017**

**-----------------------------------------------------------------------**

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (ප්‍රසංජාබැ) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර (ජාසංස) 2011 දෙසැම්බර් 27 දින එළඹි අංක ටීඑෆ් 099870 දරන ප්‍රදාන ගිවිසුමේ II (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-------------------------------------------------------------------------------**

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩිකිරීම සහ ගෘහස්ථ මට්ටමින් ස්ථානීය සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,559 කට සමාන එජඩො මිලියන 13.10 ක් වන අතර ඉන් රු.මිලියන 583.66 කට සමාන එජඩො මිලියන 5.08 ක් මූල්‍යයනය කිරීම සඳහා ප්‍රතිනිර්මාණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දන්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවා තිබූ එකතු කළ අගය එකතුව රු.මිලියන 132.06 ක් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වයට ප්‍රතිරූපීව අයකරගෙන තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 07 දින ලැබුණු රු. මිලියන 27.96 ක ප්‍රතිපූර්ණය කළ යුතු විදේශීය ප්‍රදානය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පහසුකරන ලද සම්ප්‍රදායික දීර්ඝකරන ලද සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරන ලද වැඩ හා රු. මිලියන 233.58ක පිරිවැයකට සහතික කරන ලද පිරිවැය, රු. මිලියන 214.89 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**
**----------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**
**---------------------------**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2017** දෙසැම්බර් **31** දින දක්වා | |
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 5.08 | 583.66 | 300.00 | 0.84 | 128.10 | 2.31 | 340.76 |
| ශ්‍රී ලං ර | 6.80 | 835.20 | 99.74 | 0.59 | 90.07 | 3.18 | 442.23 |
| ජා ජ ස ජ ම | 1.04 | 119.46 | 30.00 | 0.36 | 55.64 | 3.37 | 471.65 |
| ප්‍රතිලාභීන් | 0.18 | 20.68 | - | 0.02 | 2.63 | 0.22 | 32.33 |
| එකතුව | 13.10 | 1,559.00 | 429.74 | 1.81 | 276.44 | 9.08 | 1,286.97 |

ඉහත තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර වර්ෂ 06 ක් ඉකුත්වීමෙන් පසුවත් රු. මිලියන 583.66 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.08ක් වූ මුළු ප්‍රදාන වෙන් කිරීමෙන් සියයට 45.47 ක් නියෝජනය වන රු. මිලියන 340.76 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.31 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, වැඩබිම මත සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම් මත කොන්ත්‍රාත්තුව යටතේ පවතින වැඩවල දුර්වල කාර්යසාධනය හේතුවෙන්, ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඉතිරි වෙන්කිරීම උපයෝජනය කිරීමේ හැකියාව සැකමුසු තත්ත්වයක පැවතුණි.

3.2 භෞතික කාර්යසාධනය

ලැබී ඇති තොරතුරු වලට අනුව, මළාපවාහන සම්බන්ධතා, සම්ප්‍රදායික පල්දෝරු දීර්ඝකරනලද හා පහසුකරන ලද පල්දෝරු සම්බන්ධතා හා නව විකේන්ද්‍රගත කරන ලද ජාල යන සංරචක යටතේ ව්‍යාපෘතියෙහි කටයුතු 2017 දෙසැම්බර් 31 දිනට සැළකිය යුතු ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් හා කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් වැඩබිම මත සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම යන සංරචකය යටතේ කටයුතු වල, 2017 දෙසැම්බර් 31 දිනට මන්දගාමී ප්‍රගතියක් දක්නට ලැබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) පිරිපහදු කිරීමේ ඒකක 3,785 ක් සැපයීමට හා පිහිටුවීමට හා දෙහිවල, මොරටුව, කොළොන්නාව හා ජා-ඇළ යන ප්‍රදේශ වල වැසිකිළි 1,135 ක් 2017 අගෝස්තු 31 දින වන විට ඉදිකිරීම සඳහා වැඩබිම මත සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව 2016 මැයි 16 දින කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණි. අදාළ සංරචකය යටතේ වැඩ ක්‍රියාත්මක කිරීමේදී, ශ්‍රම බලකායෙහි හිඟකම හා පිරිපහදු කිරීමේ ඒකකවල මිනිස් ශ්‍රමයෙන් සිදුකරන පිරිසැකසුම් වැඩවල කොන්ත්‍රාත්කරුගේ දුර්වල

කාර්යසාධනය වැනි හේතූන්, ප්‍රමාදයන් ඇතිකර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඇති වූ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පිරිපහදු කිරීමේ ඒකක පිහිටුවීමට වෙනත් කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට 2018 වර්ෂයේදී නව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි.

(ආ) මීට අමතරව, එම ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ අවම ඉල්ලුම හේතුවෙන් කොළොන්නාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රදේශවල ජීවත්වන පවුල් 950 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා වූ සැලසුම් හා අදාළ ප්‍රදේශයෙහි වැසිකිළි 285 ක් ඉදිකිරීම අත්හැර දමා තිබුණි. ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.13 ක පරිපාලන පිරිවැයක් ව්‍යාපෘතිය විසින් දරන ලද බව නිරීක්ෂණය විය.

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා වන කොන්ත්‍රාත්තුවට සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුට රු.මිලියන 88.40 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2016 ජූලි මස ප්‍රදානයකර තිබුණු අතර එය 2017 අගෝස්තු 31 වන විට අයකරගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 68.25 ක ඉතිරි වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතුණි.